# අධ්‍යාපන අමාත්‍යාංශය

## ගණිතය ඉගැන්වීම සඳහා උසස් සහතික පත්‍ර පාඨමාලාව - 2019

අධ්‍යාපන අමාත්‍යාංශයේ ගණිත ශාඛාව සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ගණිත දෙපාර්තමේන්තුව එක්ව, රජයේ පාසල්වල ගණිතය ඉගැන්වීමේ නිරත එහෙත් පත්වීම් විෂය ගණිතය නොවන ගුරුභවතුන් සඳහා මෙහෙයවනු ලබන ඉහත සඳහන් සය මාසික පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම් :**

1. ඕනෑම විෂය ක්ෂේත්‍රයක් යටතේ අ. පො. ස. උසස් පෙළ විභාගය සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් සහිත ව සමත්ව තිබීම

   සහ

2. අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගයේ දී ගණිත විෂය සඳහා අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් (C) ලබා තිබීම

   සහ

3. රජයේ පාසලක ස්ථිර පත්වීම් සහිත ගුරුවරයෙකු වීම සහ 6 සිට 11 ශ්‍රේණිය දක්වා ශ්‍රේණිවල ගණිතය ඉගැන්වීම පිළිබඳව අවම වශයෙන් වසර පහක පළපුරුද්දක් තිබීම. 10, 11 ශ්‍රේණිවලට උගන්වන ගුරුවරුන් සඳහා ප්‍රමුඛතාවය හිමිවේ.

   සහ

4. 2019 ජුනි 28 දිනට වයස අවුරුදු 45ට අඩු අයෙකු වීම.

**බඳවා ගැනීමේ ක්‍රමය :**

ඉහත සුදුසුකම් සපුරා ඇති සියලු ම අයදුම්කරුවන් සඳහා ජාතික අධ්‍යාපන ආයතනය මගින් තෝරා ගැනීමේ පරීක්ෂණයක් පවත්වනු ලබන අතර එම පරීක්ෂණයෙන් උපරිම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් 100 දෙනා (සිංහල මාධ්‍යය 50ක් සහ දෙමළ මාධ්‍යය 50ක වශයෙන්) පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකම් ලබයි. මෙම පාඨමාලාව සඳහා කිසිදු මුදලක් අය නොකරන අතර වෙනත් කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

**අයදුම් කළ යුතු ආකාරය :**

අධ්‍යාපන අමාත්‍යාංශයේ www.moe.gov.lk වෙබ් අඩවියේ දක්වා ඇති අයදුම්පත්‍රය සම්පූර්ණ කර, පාසලේ විදුහල්පති හරහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය සඳහා යොමු කර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අනුමැතිය සහිත ව "**අධ්‍යාපන අධ්‍යක්ෂ, ගණිත ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල**" යන ලිපිනයට, ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. අයදුම්පත බහාලන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ පාඨමාලාවේ නම සහ ඔබ පාසල අයත් පළාත සඳහන් කරන්න.

එසේම මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ (online system) https://goo.gl/forms/JSIqqJGjknLGgT593 ලිපිනයේ ඇතුළත් තොරතුරු නිවැරදිව සම්පූර්ණ කර ජාතික අධ්‍යාපන ආයතනය වෙත ද අයදුම්පත් සෘජුව යොමු කළ හැකිය. අයදුම්පත් බාර ගන්නා අවසාන දිනය 2019 ජුනි 28 වන අතර අසම්පූර්ණ හෝ ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ලේකම්**
**අධ්‍යාපන අමාත්‍යාංශය**